## දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා, නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන්ම සම්පාදනය කිරීම

# හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුව අංක 1897/15 හා 2015.01.18 දිනැති අතිවිශේෂ ගැසට්පත්‍රය අනුව අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතට පත් වූ අතර, අංක 1933/13 හා 2015.09.21 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අධිකරණ අමාත්‍යාංශයේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව නීති පැනවීම සඳහා පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනු නීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීම දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම රාජ්‍ය අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනු නීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන රාජකාරියකි.

**1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ :-**

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනුනීති කෙටුම්පත් කිරීම.

(3) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.

(4) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම,

(5) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

පනත්, උපකාරක නීති, පළාත් සභා ප්‍රඥප්ති සහ පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත් කිරීමේ දී ඒ සම්බන්ධව අවශ්‍ය වන නෛතික උපදෙස් ලබා දීම ද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලැබේ.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුව යි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික නීති, නීති සංශෝධන හා උපකාරක නීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුදා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

**2. කාර්ය මණ්ඩලය**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සංයුතිය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 151 ක් වන අතර 2015 වර්ෂයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 80 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෝෂ්ඨ මට්ටම | 37 | 25 |
| තෘතීය මට්ටම | 28 | 03 |
| ද්විතීය මට්ටම | 62 | 29 |
| ප්‍රාථමික මට්ටම | 24 | 23 |

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2015.12.31 දිනට කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | තෘතීය මට්ටම | | | ද්විතීය මට්ටම | | | ප්‍රාථමික මට්ටම | | |
| | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | - | අයවැය සහකාර | 01 | 01 | රියදුරු | 10 | 09 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 (වැ.බ.) | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 02 | ගිණුම් සහකාර | 01 | - | කාර්යාල කාර්ය සහායක | 14 | 14 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 03 01 (වැ.බ.) | භාෂා පරිවර්තක | 24 | 01 | පුස්තකාලයාධිපති | 01 | 01 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 02 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28* | 17 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 20 | 15 | | | | ලේඛන සහකාර | 20 | 07 | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | සංස්කාරක | 11 | 03 | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 01 | 01 | | | | | | | | | |
| එකතුව | 37 | 25 | | 28 | 03 | | 62 | 29 | | 24 | 23 |
| මුළු එකතුව | | | | අනුමත ගණන | | 151 | තත්‍ය ගණන | | | | 80 |

*රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 28 දෙනෙකු අනුමත අතර, ලේඛන සහකාර 20 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණ ද, ලේඛන සහකාර නිලධාරීන් 10 දෙනෙකු පමණක් බඳවා ගෙන ඇත. ලේඛන සහකාර නිලධාරීන් 10 දෙනාගෙන් 03 දෙනෙකු රාජ්‍ය කළමනාකරණ සහකාර පත්වීම් ලබා ස්ථාන මාරු වී ගොස් ඇත.

## දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 151 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂයේ සිටි තත්‍ය සේවක සංඛ්‍යාව 80 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 71 ක් පිරවීමට තිබේ :-

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

(අ) අතිරේක නීති කෙටුම්පත් සම්පාදක තනතුරේ වැඩ බැලීම සඳහා ජ්‍යෙෂ්ඨතම නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරිය පත්කර ඇති අතර, ඉදිරියේ දී විධිමත්ව ඇය එම තනතුරට පත්කිරීමට කටයුතු කෙරෙනු ඇත.

(ආ) නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 02 කි. එක් තනතුරක වැඩබැලීම සඳහා ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයෙකු පත්කර ඇති අතර, ඉදිරියේ දී විධිමත්ව එම තනතුරට පත්කිරීමට කටයුතු කෙරෙනු ඇත. අනෙක් පුරප්පාඩුව පිරවීමට අදාළ සේවා කාලය සම්පූර්ණ වූ පසු ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරයකු තොරා ගත යුතු ය.

(ඇ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 06 ක් පුරප්පාඩු වී පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, සුදුසුකම්ලත් එනම් වසර දහයක (10) සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට නොහැකිව පවතී.

(ඈ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 05 කි. 2015.12.31 දින වන විට, පුරප්පාඩු 04 ක් සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී තිබුණු අතර, බඳවා ගැනීමට අදාල නිවේදනය රජයේ ගැසට් පත්‍රයේ පළ කර ඇත.

**තෘතීය මට්ටම**

පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, පිළිතුරු මේ වන තෙක් ලැබී නොමැත.

(ආ) භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 23 කි. පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) 2015 වර්ෂය අවසන් වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුර පුරප්පාඩුව පවතී.

**ද්විතීය මට්ටම**

(අ) ගිණුම් සහකාර තනතුර පුරප්පාඩුව පවතී. 2015 වර්ෂය තුළ දී පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇති අතර, සුදුසු නිලධාරියකු ලද පසු ස්ථාන මාරු කර එවීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ඇ) ලේඛන සහකාර තනතුරෙහි පුරප්පාඩු 13 ක් හා සංස්කාරක තනතුරෙහි පුරප්පාඩු 08ක් පවතී. අවසන්වරට ලේඛන සහකාර සහ සංස්කාරක නිලධාරීන් බඳවා ගැනීම් සිදු කරන ලද විභාගයේ ප්‍රතිඵල මත ම දැනට පවතින පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලා ඇති අතර, පත්වීම් බලධාරියා විමසා කටයුතු කරන ලෙස දන්වා ඇත.

**ප්‍රාථමික මට්ටම**

(අ) රියදුරු සේවයේ එක් පුරප්පාඩුවක් පවතී. පුරප්පාඩුව සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවා ඇත.

**3. දෙපාර්තමේන්තුවේ අංශ**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ආයතන හා පාලන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් :-**

- රාජ්‍ය ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- නීති සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

## 2015 වර්ෂයට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධ විස්තර සටහන

| | කෙටුම්පත් කිරීම (වර්ෂය මුල) | වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලුම් සංඛ්‍යාව | පවතින පනත් සඳහා ලද නව ඉල්ලීම් | එකතුව | කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශවයන් වෙත ලබාදුන් සංඛ්‍යාව | වසන ලද ගොනු | සම්බන්ධ කරන ලද ගොනු | කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම මූලික හා සංශෝධන නීති | 162 | 59 | 5 | 226 | 32 | - | - | 194 |
| පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් | 82 | 10 | 2 | 94 | 5 | - | - | 89 |
| පළාත් සභා ප්‍රඥප්ති | 19 | 4 | - | 23 | - | - | - | 23 |
| උපකාරක නීති (නියෝග, රීති, නියමයන් ආදිය) | 124 | 16 | 113 | 253 | 129 | - | - | 124 |

## 2015 වර්ෂය තුළ පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද පනත් කෙටුම්පත්

| අනු අංකය | දෙපාර්තමේන්තු ලිපිගොනු අංකය | පනත් අංකය | පනත් කෙටුම්පතෙහි නම |
|---|---|---|---|
| 01 | එල්.ඩී.ඕ. 50/2015 | 01/2015 | විසර්ජන (සංශෝධන) පනත |
| 02 | එල්.ඩී.ඕ. 46/2015 | 02/2015 | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත |
| 03 | එල්.ඩී.ඕ. 8/2015 | 03/2015 | දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරිය (සංශෝධන) පනත |
| 04 | එල්.ඩී.ඕ. 46/2007 | 04/2015 | අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත |
| 05 | එල්.ඩී.ඕ. 21/2012 | 05/2015 | ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත |
| 06 | එල්.ඩී.ඕ. අයි.එන්.සී. 23/2011 | 06/2015 | මඩහපොළ ශ්‍රී රත්නපාලාරාම විහාරස්ථ ශාසන හා බෞද්ධ අධ්‍යාපන සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත |
| 07 | එල්.ඩී.ඕ. 20/2015 | - | දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය |
| 08 | එල්.ඩී.ඕ. 25/2013 | 07/2015 | ආගාමික හා විගාමික (සංශෝධන) පනත |
| 09 | එල්.ඩී.ඕ. 39/2009 | 08/2015 | ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත |
| 10 | එල්.ඩී.ඕ. 11/2015 | 09/2015 | දේශීය ආදායම් (සංශෝධන) පනත |
| 11 | එල්.ඩී.ඕ. 10/2015 | 10/2015 | මුදල් පනත |
| 12 | එල්.ඩී.ඕ. 16/2015 | 11/2015 | එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත |
| 13 | එල්.ඩී.ඕ. 14/2015 | 12/2015 | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත |
| 14 | එල්.ඩී.ඕ. 13/2015 | 13/2015 | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත |
| 15 | එල්.ඩී.ඕ. 12/2015 | 14/2015 | ඔට්ටු ඇල්ලීම හා සූදුබදු (සංශෝධන) පනත |
| 16 | එල්.ඩී.ඕ. 42/2015 | 15/2015 | විසර්ජන (සංශෝධන) පනත |
| 17 | එල්.ඩී.ඕ. 38/2015 | 16/2015 | විසර්ජන පනත |

සටහන :

- එල්.ඩී.ඕ. යනුවෙන් අදහස් වන්නේ නව නීති හා සංශෝධන නීතිවලට අදාළ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.
- එල්.ඩී.ඕ. අයි.එන්.සී. යනුවෙන් අදහස් වන්නේ පෞද්ගලික මන්ත්‍රීන්ගේ සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

# ආයතන අංශය හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, වාහන පහසුකම් හා සම්බන්ධ කටයුතු සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

## (1) බඳවා ගැනීම, උසස් කිරීම් සහ විනය පාලනය

නීති කෙටුම්පත් සම්පාදකවරයා විශ්‍රාම යෑම හේතුවෙන් පුරප්පාඩු වූ තනතුර සඳහා එවකට අතිරේක නීති කෙටුම්පත් සම්පාදකවරිය ලෙස කටයුතු කල නීති නිලධාරිනිය නීති කෙටුම්පත් සම්පාදක තනතුරට උසස් කරන ලදී.

## (2) පුහුණු කිරීම්

### දේශීය පුහුණු

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය පුහුණුවීම් සඳහා යොමුකර ඇත:

i. *<u>ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය</u>*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 01 |
| සහකාර අධ්‍යක්ෂ | - | 01 |
| භාෂා පරිවර්තක | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 01 |

ii. *<u>නිපුණතා සංවර්ධන පදනම</u>*

| | | |
|---|---|---|
| නීති නිලධාරීන් | - | 05 |
| පුස්තකාලයාධිපති | - | 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 10 |
| ලේඛන සහකාර | - | 01 |
| කාර්යාල සේවක සේවය | - | 02 |

iii. <u>*ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය*</u>

| | | |
|---|---|---|
| ලේඛන සහකාර | - | 02 |
| කාර්යාල සේවක සේවය | - | 01 |

iv. <u>*පූග් සර්විස් පෞද්ගලික සමාගම*</u>

| | | |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - | 01 |

v. <u>*කොළඹ විශ්වවිද්‍යාලය*</u>

| | | |
|---|---|---|
| ලේඛන සහකාර | - | 01 |

vi. <u>*ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය*</u>

| | | |
|---|---|---|
| පුස්තකාලයාධිපති | - | 01 |

ඉහත දක්වා ඇති පුහුණුවීම් හැර, මෙම දෙපාර්තමේන්තුවේ පුස්තකාලයාධිපතිනිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමය මඟින් පවත්වන ලද වැඩමුළු දෙකට සහ සම්මන්ත්‍රණයකට ද සහභාගි වී ඇත. තව ද, එම නිලධාරිනියට කැලණිය විශ්වවිද්‍යාලයේ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ප්‍රතිපාදන ලබාදීමට කටයුතු කර ඇත.

**විදේශීය පුහුණු**

i. දෙපාර්තමේන්තුවේ අතිරේක නීති කෙටුම්පත් සම්පාදකවරිය ද, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරයෙක් සහ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරියක් ද කොරියාවේ පැවති 5 වන ගිවිසුම් බලාත්මක කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුවට සහභාගි විය.

ii. ඕස්ට්‍රේලියාවේ පැවති සාක්ෂිකරුවන් සහ වින්දිතයින් ආරක්ෂා කිරීමේ සංසදයට ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරියක් සහභාගී විය.

iii. එක්සත් රාජධානියේ පැවති නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ පාඨමාලාව - 2015 සඳහා නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරියක් සහභාගි විය.

iv. ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති ජාත්‍යන්තර නීති කෙටුම්පත් කිරීමේ ආයතනයේ පුහුණු වැඩමුළුව - 2015 සඳහා නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදකවරියක් සහභාගි විය.

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ සමුළු - 2015 වර්ෂය**

| | සම්මේලනයේ නම සහ පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරියාගේ නම |
|---|---|---|
| 1. | 5 වන ගිවිසුම් බලාත්මක කිරීම පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - කොරියාව | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක ඩී.එස්.එච්.කුමාරජීව මිය<br><br>නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක වී.විමලේෂ්වරන් මයා<br><br>සහකාර නීති කෙටුම්පත් සම්පාදක ඒ.කේ.ඩී.ජී.අයි.කේ.අබේවික්‍රම මෙය |
| 2. | සාක්ෂිකරුවන් සහ වින්තිකරුවන් ආරක්ෂා කිරීමේ සංසදය - ඕස්ට්‍රේලියාව | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී.වීරක්කොඩි මිය |

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු - 2015 වර්ෂය**

| | පුහුණුවේ නම සහ පැවැත් වූ රට | සහභාගී වූ නිලධාරියාගේ නම |
|---|---|---|
| 1. | නීති ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ පාඨමාලාව - 2015, එක්සත් රාජධානිය | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක කේ.ආර්.වයි.හපුආරච්චි මිය |
| 2. | ජාත්‍යන්තර නීති කෙටුම්පත් කිරීමේ ආයතනය - 2015, ඇමෙරිකා එක්සත් ජනපදය | නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී.කුලසේන මෙය |

## (3) අනෙකුත් ආයතනික හා පාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන් පිළිබඳව නිලධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය උදෙසා දෙපාර්තමේන්තුවේ 1 ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිතව ඇති අතර, 2015 වර්ෂයේ දේශීය හා විදේශීය පොත් 66 ක් මිළදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2015 වර්ෂයේ දී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා සංස්කෘතික උත්සව පැවැත්වීම, සමාජ සත්කාරක සේවයක් සිදු කිරීම (පිළිකා රෝහලේ ප්‍රතිකාර ලබන දරුවන් සඳහා වියළි ආහාර බෙදා දීම) සහ මානසික සංවර්ධනය උදෙසා ආගමික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මඟින් ඉටු කරයි.

iv. දෙපාර්තමේන්තුවේ සියලුම පරිගණක ජාලගත කර ඇති අතර, සියලුම මාණ්ඩලික නිලධාරීන් මෙන්ම අනෙකුත් සුදුසු නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත. අනෙකුත් නිලධාරීන්ට ද පරිගණක හා අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත. සියලුම නිලධාරීන්ට නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම මගින් e-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (නව නීති සහ සංශෝධන නීති) සහ ප්‍රතිශෝධනය කරනු ලබන උපකාරක නීති, අදාළ රාජ්‍ය භාෂාවලට පරිවර්තනය කිරීම ද දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම ද භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා උපකාරක නීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

# ගිණුම් අංශය

## 230 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**2015.01.01 - 2015.12.31**

**වැය විස්තරය**

ශීර්ෂය : 230 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩසටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2015.01.01 සිට 2015.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| **පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු.)** | **පරිපූරක ප්‍රතිපාදන** | **මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්** | **ශුද්ධ ප්‍රතිපාදන (රු.)** | **මුලු වියදම් (රු.)** |
|---|---|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 42,800,000 | 14,600,000 | - | 57,400,000 | 55,147,736 |
| අනෙකුත් වියදම් | 31,250,000 | - | (810,000) | 30,440,000 | 21,059,102 |
| **පුනරාවර්තන වියදම්වල එකතුව** | **74,050,000** | **14,600,000** | 810,000 | **87,840,000** | **76,206,838** |

2015.01.01 සිට 2015.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| **ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර** | **අයවැය ප්‍රතිපාදන (රු.)** | **මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම්** | **ශුද්ධ ප්‍රතිපාදන (රු.)** | **මුලු වියදම් (රු.)** |
|---|---|---|---|---|
| **<u>මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම</u>** | | | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000 | | 500,000 | 367,628 |
| **<u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u>** | | | | |
| 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 1,000,000 | 810,000 | 1,810,000 | 1,805,442 |

| | | | | |
|---|---|---|---|---|
| **<u>මානව සම්පත් සංවර්ධනය</u>**<br><br>2401 - කාර්ය මණ්ඩල පුහුණු (අ) | 7,500,000 | | 7,500,000 | 6,778,529 |
| **<u>වෙනත් මූලධන වියදම්</u>**<br><br>2502 - ආයෝජන - නීති ග්‍රන්ථ මිලදී ගැනීම | 1,000,000 | | 1,000,000 | 866,748 |
| **<u>ශ්‍රී ලංකා නිති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම</u>**<br><br>2502 - ආයෝජන | 60,000,000 | | 60,000,000 | 2,102,258 |
| **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **70,000,000** | **810,000** | **70,810,000** | **11,920,605** |

(ආ) 2015.01.01 සිට 2015.12.31 දක්වා ආදායම් විස්තරය

| විස්තරය | ඇස්තමේන්තුගත ආදායම (රු.) | ආදායම (රු.) |
|---|---|---|
| පොළිය - වෙනත් | 380,000 | 421,430 |

(ආ) අත්තිකාරම් ගිණුම - 230011
(2015.01.01 - 2015.12.31)

| | වියදමෙහි උපරිම සීමාව (රු.) | ලැබීම්වල අවම සීමාව (රු.) | හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු.) |
|---|---|---|---|
| 2015 ඇස්තමේන්තුව | 4,000,000 | 1,500,000 | 19,000,000 |
| මු.රෙ. 503(1) - 2015.12.31 දිනට ගැලපීම් කිරීමට පෙර | 1,622,836 | 2,347,862 | 9,909,427 |

# විසර්ජන ගිණුම 2015

වියදම් ශීර්ෂ අංකය: 230 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ~~ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | (1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | (2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් | (3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම් | (4) මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2+3) | (5) මුළු වියදම | (6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මවීම (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ජී 2 ආකෘතියට අනුව) |
|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 74,050,000 | 14,600,000 | (3,540,500)<br>2,730,500 | 87,840,000 | 76,206,838 | 11,633,162 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | **74,050,000** | **14,600,000** | **(810,000)** | **87,840,000** | **76,206,838** | **11,633,162** | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 70,000,000 | - | 810,000 | 70,810,000 | 11,920,605 | 58,889,395 | 2 |
| | උප එකතුව (මූලධන) | **70,000,000** | - | **810,000** | **70,810,000** | **11,920,605** | **58,889,395** | |
| | මුළු එකතුව | **144,050,000** | **14,600,000** | **0** | **158,650,000** | **88,127,443** | **70,522,557** | |

පිටු අංක 02 සිට 15 දක්වා ඩී.ජී.එස්.ජී 2 සිට ඩී.ජී.එස්.ජී 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 16 සිට 19 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : ලේකම්
දිනය : අධිකරණ අමාත්‍යාංශය, උපරිමාධිකරණ සංකීර්ණය, ... කොළඹ - 12.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 15/03/2016

දීපානී කුමාරජීව
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
අංක. 80, අධිකරණ මාවත,
කොළඹ 12.

ප්‍රධාන ගණකාධිකාරි/ ~~අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2016.03.08

ටී. ටී. නිලන්ති ප්‍රනාන්දු
ප්‍රධාන ගණකාධිකාරි
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

1

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

විගණන විමසුම්-AUDIT QUERY- கணக்காய்வு விசார

| | | | |
|---|---|---|---|
| විමසීම් අංකය<br>விசாரணை இலக்கம<br>Query No.. | JPA/B/LDD/02/2015/01 | නිකුත් කරන දිනය<br>வழங்கிய திகதி<br>Date of issue | 2016 මැයි 23 දින |

Addressed to
වෙතටයි — නීති කෙටුම්පත් සම්පාදක

24 MAY 2016

විෂයය / Subject / விடயம் — විසර්ජන ගිණුම් විගණනය - 2015

ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

මෙය පැහැදිලි කිරීම සඳහා තොරතුරු කැඳවීමක්/විමසීමක් වන අතර විගණන වාර්තාවක් නොවේ.
This is only query calling for information for clarification and not an audit report
இவ்விசாரணை தகவல்களைப் பெற்றுக் கொள்ளவும், பகுப்பாய்வதற்காகவுமே அன்றி இது ஒரு கணக்காய்வு அறிக்கை அல்ல.

යථෝක්ත විසර්ජන ගිණුම සම්බන්ධයෙන් කරනු ලැබූ විගණන පරීක්ෂණයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

2) විසර්ජන ගිණුම පිළියෙල කිරීම

(i) 2015 දෙසැම්බර් 09 දිනැති අංකBD/CBP/4/1/22-2015 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.1.1 ඡේදය අනුව 2015 ඔක්තෝබර් 10 දින දක්වා සිදුකරන ලද මු.රෙ. 66 යටතේ වන මාරු කිරීම් හා ඒ දක්වා දෙන ලද අතිරේක ප්‍රතිපාදන තිබූ බැවින් 2015 ඔක්තෝබර් 11 දිනෙන් පසුව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන පමණක් විසර්ජන ගිණුම සකස් කිරීමේදී සැලකිල්ලට ගතයුතු වේ. එසේ වුවද එම විධිවිධාන පිළිපැදීමකින් තොරව DGSA 2 සහ DGSA 3 ආකෘති පිළියෙල කර තිබුණි. විස්තර පහත දැක්වේ.

2016/08/25


අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, புத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථන / தொலைபேசி / Telephone — 2887028 -34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. — 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. — oaggov@sltnet.lk

| (අ) වැය විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන්කිරීම | | මු.රෙ .66 හා 69 මාරු කිරීම | |
|---|---|---|---|---|
| | 2015 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුව අනුව DGSA 3 ආකෘතියේ සටහන් කළයුතු ප්‍රතිපාදනය | DGSA 3 ආකෘතියේ (1) තීරුවේ සටහන් කළ ප්‍රතිපාදනය | DGSA 3 ආකෘතියේ (3) තීරුවේ සටහන් කළයුතු වටිනාකම | DGSA 3 ආකෘතියේ (3) තීරුවේ සටහන් කර ඇති වටිනාකම |
| | රු. | රු. | රු. | රු. |
| පුද්ගල පඩිනඩි | 57,400.000 | 42,800,000 | - | - |
| අනෙකුත් වියදම | 31,250,000 | 31,250,000 | 3,510,500 | (3,540,000) 2,730,500 |

(ආ) තථ්‍ය මු.රෙ. 66 හා 69 මාරුකිරීම් රු.3,510,500 ක් වුවද, DGSA 2 ආකෘතියේ (3) තීරුව අනුව මු.රෙ. මාරුකිරීම රු.3,540,500 ක් ලෙස සටහන් කර තිබුණි.

(ඇ)තථ්‍ය පරිපූරක ප්‍රතිපාදන කිසිවක් නොමැති වුවද, DGSA 2 හා DGSA 3 ආකෘති වල (3) තීරුවේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.14,600,000 ක් සටහන් කර තිබුණි.

(ii)2016 ජනවාරි 19 දිනැති අංක SA/MA/MA/C'CULAR දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව සටහන (i) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව ආකෘතිය ප්‍රකාරව සකස් කර නොතිබුණි.

**3) පාඩු හා හානි**

2015 නොවැම්බර්මාසයේදී K M -0905 දරන මෝටර් රථයේ ස්වයංක්‍රිය යතුර නැතිවීම පිළිබඳව හානි හා පාඩු ලේඛනයේ සටහන් කර ඇතත් ඒ සම්බන්ධව මු.රෙ. 104 ප්‍රකාරව විගණකාධිපති වෙත වාර්තා කර නොතිබූ අතර, ඩී.ජී.එස්. ඒ.7 ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.

3) අයවැය පාලනය

(i)නිසි ලෙස කරුණු සොයා බැලීමකින් පසුව අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන පමණක් ලබාගැනීමට කටයුතු නොකිරීමෙන් හෝ කළමනාකරණය විසින් නියමිත කාල වකවානු තුළදී නිශ්චිත කාර්යසාධන ඉලක්ක සපුරා ගැනීමට කටයුතු නොකිරීම නිසා හෝ පහත සඳහන් ප්‍රතිපාදන වලින් ඉතිරිවීම සියයට 06 සිට 49 දක්වා පරාසයක පැවතුණි.

| වැය ශීර්ෂය | ශුද්ධ ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| 1 - 1 - 1002 | 1,500,000 | 509,699 | 990,301 | 66 |
| 1 - 1 - 1101 | 70,000 | 44,238 | 25,762 | 37 |
| 1 - 1 - 1102 | 1,500,000 | 714,766 | 785,234 | 52 |
| 1 - 1 - 1302 | 1,060,000 | 456,894 | 603,106 | 57 |
| 1 – 1 - 1402 | 2,600,000 | 2,458,618 | 141,382 | 05 |
| 1 - 1 - 1403 | 4,000,000 | 2,807,581 | 1,192,419 | 30 |
| 1 - 1 - 1404 | 7,434,500 | 1,500,000 | 5,934,500 | 80 |
| 1 - 1 - 1405 | 1,595,000 | 1,275,900 | 319,100 | 20 |
| 1 - 1 - 1506 | 570,000 | 388,398 | 181,602 | 32 |
| 1 - 1 - 2001 | 500,000 | 367,628 | 132,372 | 26 |
| 1 - 1 - 2401 | 7,500,000 | 6,778,529 | 721,471 | 10 |
| 1 - 1 - 2502 | 1,000,000 | 866,748 | 133,252 | 13 |
| 1 - 1 -1- 2502 | 60,000,000 | 2,102,258 | 57,897,742 | 96 |

(ii) නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කිරීම ව්‍යාපෘතිය ආරම්භකිරීම සඳහා පහතදැක්වෙන පරිදි ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර අදාල ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් 2011 සිට 2013 දක්වා ප්‍රතිපාදන මුළු මුදල රු.132,500,000 ඉතිරි වී තිබුණි. 2014 පෙබරවාරි 28 දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ අතර 2014 සහ 2015 වර්ෂවලදී මෙම ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් 659,934 ක් හා රු.2,102,258 ක් නිලධාරීන්ගේ දීමනා ලෙස ගෙවීම් කර තිබූ අතර මෙම මුදල 2014 වර්ෂයේ මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදල වූ රු.32,175,000 න් සියයට 2 ක් හා 2015 වර්ෂයේදී මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදල වූ රු.60,000,000 න් සියයට 3.5 ක් විය.

| වර්ෂය | ඇස්තමේන්තුව | වියදම | ඉතිරිය |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2011 | 20,000,000 | - | 20,000,000 |
| 2012 | 72,500,000 | - | 72,500,000 |
| 2013 | 40,000.000 | - | 40,000.000 |
| 2014 | 32,175,000 | 659,934 | 31,515,066 |
| 2015 | 60,000,000 | 2,102,258 | 57,897,742 |

යථෝක්ත කරුණු පිළිබඳව ඔබගේ නිරීක්ෂණ හා ගනුලබන ක්‍රියාමාර්ග දින 03 ක් ඇතුළත විගණනය වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලමි.

එච්.එම්.එස්.කේ. සිරිවර්ධන
විගණන අධිකාරි
සහකාර විගණකාධිපති වෙනුවට

මගේ අංකය / எனது இல. / My No. } JPA/B/LDD/02/2015/03 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2016 ජූනි 15 දින.

අධ්‍යක්ෂ ජනරාල්

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

ශීර්ෂය - 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව -2015 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

ශීර්ෂය - 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2015 වර්ෂය සඳහා වූ 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ජී 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2015 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2015 අංක 1 දරන හා 2015 අංක 15 දරන විසර්ජන (සංශෝධන) පනත්වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

2. විගණන විෂය පථය

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන 2015 අංක 01 දරන හා 2015 අංක 15 දරන විසර්ජන ( සංශෝධන ) පනත් වලින් සංශෝධිත 2014 අංක 47 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම 2015 දෙසැම්බර් 10 දිනැති අංක 245/2015 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

3. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 125 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරීම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යංශයේ හා අමාත්‍යංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ට හා ගණන්දීමේ නිලධාරීන්ට පැවරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට හා චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරි

ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාම මෙම වගකීමට ඇතුළත් වේ.

## 4. විගණන නිරීක්ෂණ

2015 වර්ෂය සඳහා ශීර්ෂය - 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.3 ඡේදය දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### 4.1 විසර්ජන ගිණුම පිළියෙල කිරීම

2015 දෙසැම්බර් 09 දිනැති අංක BD/CBP/4/1/22-2015 දරන ජාතික අයවැය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.1.1 ඡේදය අනුව 2015 ඔක්තෝබර් 10 දින දක්වා සිදුකරන ලද මූ.රෙ. 66 යටතේ වන මාරු කිරීම හා ඒ දක්වා දෙන ලද අතිරේක ප්‍රතිපාදන ගලපා තිබූ බැවින් 2015 ඔක්තෝබර් 11 දිනෙන් පසුව මුදල් රෙගුලාසි 66 මාරු කිරීම් හා පරිපූරක ප්‍රතිපාදන පමණක් විසර්ජන ගිණුම සකස් කිරීමේදී සැලකිල්ලට ගතයුතු වේ. ගිණුමේ දත්ත වල ශුද්ධ ප්‍රතිඵලයට බලපෑමක් නොවූවද, චක්‍රලේඛයේ විධිවිධාන පිළිපැදීමකින් තොරව DGSA 2 සහ DGSA 3 ආකෘති පිළියෙල කර තිබුණි.

(i) 2015 ප්‍රතිශෝධිත ඇස්තමේන්තුවට අනුව පුද්ගල පඩිනඩි රු. 57,400,000 ක් වුවද, DGSA 3 ආකෘතියේ පුද්ගල පඩිනඩි ඇස්තමේන්තු වටිනාකම රු.42,800,000 ක් ලෙස සටහන් කර තිබුණි.

(ii) තථ්‍ය මූ.රෙ. 66 හා 69 මාරුකිරීම් රු.3,510,500 ක් වුවද, විසර්ජන ගිණුමේ මූ.රෙ. මාරුකිරීම් රු.3,540,500 ක් ලෙස සටහන් කර තිබුණි.

(iii) තථ්‍ය පරිපූරක ප්‍රතිපාදන කිසිවක් නොමැති වුවද , විසර්ජන ගිණුමේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.14,600,000ක් සටහන් කර තිබුණි.

(iv) සටහන (i) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබද වාර්තාව 2016 ජනවාරි 19 දිනැති අංක SA/MA/MA/C'CULAR දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුව ආකෘතිය ප්‍රකාරව සකස් කර නොතිබුණි.

4.2 අධිප්‍රතිපාදන සැලැසීම

(i) සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයයන් 12 ක ප්‍රතිපාදනවල අධි තක්සේරුව නිසා වර්ෂය අවසානයේ ප්‍රතිපාදනයේ ඉතිරිය සියයට 10 සිට සියයට 96 දක්වා වූ පරාසයක විය.

(ii) නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ හා ඒකාබද්ධ කිරීම ව්‍යාපෘතිය ආරම්භකිරීම සඳහා 1-1-1-2502 වැය ශීර්ෂයෙන් ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර අදාල ව්‍යාපෘතිය ආරම්භ නොකිරීම හේතුවෙන් 2011 සිට 2013 දක්වා ප්‍රතිපාදන මුළු මුදල රු.132,500,000 ඉතිරි වී තිබුණි. 2014 පෙබරවාරි 28 දින මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී තිබූ අතර 2014 සහ 2015 වර්ෂවලදී මෙම ව්‍යාපෘතිය සඳහා පිළිවෙලින් 659,934 ක් හා රු.2,102,258 ක් නිලධාරීන්ගේ දීමනා ලෙස ගෙවීම් කර තිබූ අතර මෙම මුදල 2014 වර්ෂයේ මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදල වූ රු.32,175,000 න් සියයට 2 ක් හා 2015 වර්ෂයේදී මුළු ශුද්ධ ප්‍රතිපාදන මුදල වූ රු.60,000,000 න් සියයට 3.5 ක් විය.

4.3 පාඩු හා අත්හැරීම්

සමාලෝචිත වර්ෂය තුල සිදුවී තිබූ රු.32,450 ක් වූ වාහන අලාභයක් සම්බන්ධයෙන් විස්තර විසර්ජන ගිණුම මගින් හෙළිදරව් කර නොතිබුණි.

**5.** පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් අධිකරණ පරිපාලනයට අදාලව ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

කේ. උපනන්ද

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාළ අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන අනුනීති පුනරීක්ෂණය (revision) කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

තව ද, ශ්‍රී ලංකාවේ නීති ප්‍රඥප්ති නිල වශයෙන් ඒකාබද්ධ කොට සහ ප්‍රතිශෝධනය කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් ප්‍රකාශයට පත්කිරීමේ වසර හතරක ව්‍යාපෘතියේ කටයුතු සිදු කරමින් පවතී.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ දක්වා ඇති පරිදි, 2015 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්බන්ධව කටයුතු සිදුකර ඇත.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைஞர் திணைக்களம்,
இல.80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

තැ.පෙ. / அ.பெ. / P.O.Box 554

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

දුරකථන / தொலைபேசி / Telephones : 542991, 333394

විදුලි පණිවුඩ / Telegrams : කෙටුම්පත්, කොළඹ : DRAFTSMAN, Colombo

ෆැක්ස් /பெக்ஸ் /Fax: 325185, 435935

E –mail : ldds1@sltnet.1k

| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல / My No. LDD/Ac/06/06 | ඔබේ අංකය. / உமது இல. / Your No. JPA/B/LDD/02/2015/01 | දිනය. / திகதி / Date. 2016.06.02 |

සහකාර විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල.

විසර්ජන ගිණුම් විගණනය - 2015

<u>ශීර්ෂ 230 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>

උක්ත මැයෙන් මා අමතන ලද ඔබගේ සමාංක හා 2016.05.23 දිනැති ලිපිය සම්බන්ධයෙනි.

ඒ අනුව උක්ත ලිපියෙහි සඳහන් කරුණු පිළිබඳව නිරීක්ෂණ සහ ගනු ලබන ක්‍රියා මාර්ග පහත පරිදි ඉදිරිපත් කරනු ලැබේ.

2) <u>විසර්ජන ගිණුම පිළියෙල කිරීම</u>

(i) 2015.12.09 දිනැති අංක BD/CBP/4/1/22-2015 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.1.1 ඡේදයෙහි අමාත්‍යාංශ සම්බන්ධයෙන් සඳහන් කර ඇති බැවින් එම චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු නොකරන ලදී.

තවද සහතික කරන ලද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් ලබා ගැනීම සඳහා දින කිහිපයක්ම උත්සාහ කලද ඒවා ලබා ගත නොහැකි වී ඇත.රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පවසා ඇත්තේ සහතික කල පිටපත් ලබා දීම ප්‍රමාද වන බවයි. එසේම අන්තර්ජාලයේ ඇති දත්ත පදනම් කරගෙන අවසාන ගිණුම සකස් කරන ලෙසට ප්‍රධාන ගණකාධිකාරී වෙත දුරකතනයෙන් දන්වා ඇත. ඒ අනුව එම අවස්ථාවේ අන්තර්ජාලයේ පැවති දත්ත පදනම් කරගෙන 2015 වසරේ විසර්ජන ගිණුමේ DGSA 2 හා DGSA 3 ආකෘති පත්‍ර සකස් කර ඇත. 2015 වසරේ ගිණුම් සකස් කර අවසන් වූ පසුව සහතික කරන ලද භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් ලබා ගත හැකි වූ අතර එහිදී දැක ගත හැකි වූයේ අන්තර්ජාලයේ තිබූ දත්තයන්ට වඩා වෙනස් ආකාරයට එහි දත්ත ඇතුලත් කර ඇති බවයි. කෙසේ වෙතත් මෙම අවස්ථාව වන විට 2015 විසර්ජන ගිණුම පිළියෙල කර අවසන්ව තිබූ බැවින් සහ ගිණුමෙහි සඳහන් දත්තවල ශුද්ධ ප්‍රතිඵලයට කිසිදු වෙනසක් සිදු වී නොතිබූ බැවින් විසර්ජන ගිණුම නැවත සංශෝධනය නොකරන ලදී.

(ii) 2015.12.10 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 245/2015 අනුව අප විසින් අදාල චක්‍රලේඛය අන්තර්ජාලය තුලින් ලබා ගන්නා අවස්ථාවේ එහි ප්‍රදර්ශනය කර තිබූ ආකෘති පත්‍ර අනුව 2015 විසර්ජන ගිණුම සටහන (i) ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තාව සකස් කර ඇත. නැවත රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් ආකෘති පත්‍ර වෙනස් කර දැමුවද එය නොදැකීම නිසා එම වාර්තාව 2016.01.19 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ SA/MA/MA/C'CULAR අනුව සකස් කිරීමට නොහැකි වී ඇත.

3) <u>පාඩු හා හානි</u>

KM – 0905 දරන මෝටර් රථයේ ස්වයංක්‍රීය යතුර 2015 නොවැම්බර් මාසයේ නැති වුවද එම හානිය විධිමත්ව වාර්තා වූයේ 2015 විසර්ජන ගිණුම පිළියෙල කිරීමෙන් පසුවය. එබැවින් එය DGSA 7 ආකෘතියට ඇතුලත් කිරීමට නොහැකි වී ඇත.

3) (i) <u>අයවැය පාලනය</u>

| වැය ශීර්ෂය | ඉතිරි වීම් ප්‍රතිශතය % | ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව |
|---|---|---|
| 1-1-1002 | 66 | අතිකාල සීමා කිරීම |
| 1-1-1101 | 37 | දේශීය ගමන් සීමා වීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය |
| 1-1-1102 | 52 | හිටපු නීති කෙටුම්පත් සම්පාදකවරයාට ස්කොට්ලන්තයේ පැවති 2015 CALC සමුලුවට සහ CLC සමුලුවට සහභාගි වීමට වීසා නොලැබීම නිසා ප්‍රතිපාදන ඉතිරි විය. |
| 1-1-1302 | 57 | අපේක්ෂා කල පරිදි නඩත්තු වියදම් වැඩි නොවීම |
| 1-1-1402 | 05 | දෙපාර්තමේන්තුවේ ඇතැම් නිලධාරීන් උපරිම සීමාවට වඩා අඩුවෙන් දුරකතන ඇමතුම් ලබා ගැනීම |
| 1-1-1403 | 30 | වියදම් පාලනය කිරීම |
| 1-1-1404 | 80 | දෙපාර්තමේන්තුව අධිකරණ අමාත්‍යාංශය යටතට ගැනීම නිසා කුලී ගෙවීම අවශ්‍ය නොවීම |
| 1-1-1405 | 20 | අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් සිදු නොවීම |
| 1-1-1506 | 32 | ණය ඉල්ලුම්කරුවන් ඉදිරිපත් නොවීම |
| 1-1-2001 | 26 | අපේක්ෂා කල පරිදි ගොඩනැගිලි අලුත්වැඩියා සිදු කිරීම අවශ්‍ය නොවීම |
| 1-1-2401 | 10 | අදාල පුහුණු සඳහා සහභාගි වීමට සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරුන් ඉල්ලුම් කළද අවශ්‍ය අවම සේවා කාලය සම්පූර්ණ නොකිරීම නිසා තෝරා නොගැනීම. |
| 1-1-2502 | 13 | ලබා දුන් ඇණවුම සඳහා පොත් නොසැපයීම |
| 1-1-1-2502 | 96 | රජයේ දින 100 වැඩ පිළිවෙලට මෙම දෙපාර්තමේන්තුව ඇතුලත් වීම හේතුවෙන් සහ ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරී ඉවත් වීම හේතුවෙන් නියමිත ඉලක්කය වෙත ළඟා වීමට අපහසු විය. |

3.(ii) <u>නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම- නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව</u>

**2010 වර්ෂයේ සිට මේ දක්වා මූල්‍යමය ප්‍රගතිය,නිරීක්ෂණ හා නිගමන**

1. 2009 වර්ෂයේදී පමණ මෙම නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීමේ අවශ්‍යතාවය එවකට අධිකරණ හා නීති ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් පෙන්වා දෙන ලදුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව විසින් එයට ආරම්භයක් තබන ලදී

2. ඉන් අනතුරුව 2010 වර්ෂයේදී අදාල ව්‍යාපෘති වාර්තාව සකස් කල අතර, 2011 වර්ෂයෙදී ඊට මුදල් අමාත්‍යංශයේ අනුමැතිය ලැබී තිබුණි.

3. ව්‍යාපෘති වාර්තාව අනුමත කර ගැනීමෙන් පසු නොපමාව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගනීවි යැයි අපේක්ෂාවෙන්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව මඟින් මෙම ව්‍යාපෘතියෙහි අවශ්‍යතාවයද සලකා අයවැය ඇස්තමේන්තුවට ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

4. කෙසේ නමුත්, අදාල අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීම ඉන් අනතුරුව සිදුකල අතර, ඇස්තමේන්තුව මඟින් ප්‍රතිපාදන වෙන්කර තිබීම එම අමාත්‍ය මණ්ඩල සංදේශය සකස් කිරීමේදී ගැටලු සහගත තත්වයක් ඇති කිරීමට හේතු වී තිබුණි.

5. කෙසේ නමුත් අදාල ගැටලු සහගත තත්වයන් නිරාකරණය කර ගැනීමෙන් අනතුරුව 2014 මාර්තු මස දී අදාල අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුමැතිය ලැබුණි.

6. ඉන් අනතුරුව ව්‍යාපෘතියෙහි කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ජනාධිපති නීතිඥ පී.අයි.එස්.සමරසිංහ මහත්මිය පත්කිරීම සිදුකරගත් අතර, 2014.07.21 දින සිට අදාල ව්‍යාපෘතියෙහි වැඩ කටයුතු ආරම්භ කර අඛණ්ඩව පවත්වාගෙන ගිය බව දන්වා සිටිමි.

7. **ඒ අනුව 2010 වර්ෂයේ සිට 2014.07.21 දින දක්වා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සම්බන්ධයෙන් මූල්‍යමය වියදමක් දැරීමට සිදු නොවූ බව වැඩිදුරටත් දන්වා සිටිමි.**

8. ව්‍යාපෘතියෙහි වැඩ බෙදාහැරීමේ කටයුතු එහි ක්‍රියාත්මක සැලැස්ම අනුව 2014.09.01 දින ආරම්භ කල අතර, 2015.01.08 දින දක්වා සාමාන්‍ය පරිදි එම කටයුතු කරගෙන යන ලදී. නමුත්, 2015.01.08 දින පත්වූ නව රජයේ දින සියයේ වැඩපිළිවෙලට අදාලව කඩිනමින් සකස්කලයුතු පනත් විශාල ප්‍රමාණයක වැඩකටයුතු මෙන්ම 19 වන සහ 20 වන ව්‍යවස්ථා සංශෝධන ද සිදුකිරීමට මෙම දෙපාර්තමේන්තුවට පැවරී තිබුණු බැවින්, නීති ඒකාබද්ධ කිරීමේ සහ ප්‍රතිශෝධන කටයුතු සිදුකල සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධරයන් සහ ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධරයන් කාර්ය බහුල වූ අතර, ව්‍යාපෘතියෙහි බලාපොරොත්තු වූ ඉලක්කය ලගාකර ගැනීමට නොහැකි විය. තවද, දින 100 ඉකුත් වුවද අදාල පනත් කඩිනමින් අවසන් කිරීමට රජයේ උපදෙස් ලැබී තිබූ බැවින් ඉහත කී නීති නිලධරයන් 2015 ජුනි මස අවසන් වනතෙක් කාර්ය බහුල විය.

9. ඒ අනුව, ඉන් අනතුරුව 2015 ජුලි මස සිට ව්‍යාපෘතියෙහි කටයුතු නැවත සාමාන්‍ය පරිදි ආරම්භ කර පවත්වාගෙන ගිය බව කාරුණිකව දන්වා සිටිමි.ඒ අනුව, ඉදිරි පියවර වශයෙන් ක්‍රියාත්මක සැලැස්මට සමගාමීව ප්‍රමාද වී තිබූ වැඩ කොටස් සමග සිංහල සහ දෙමළ පනත් හි වැඩකටයුතු ආරම්භ කිරීමට සූදානම් කර තිබුනද, සංස්ථාපිත නීති අධ්‍යයන සභාව විසින්, ව්‍යාපෘතියෙහි සම්බන්ධීකරණ කටයුතු සිදුකල ජනාධිපති නීතිඥ පී.අයි.එස්.සමරසිංහ මහත්මිය 2015.11.09 දින සිට ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ විදුහල්පති ලෙස පත්කල බැවින් එම නිලධාරිනිය නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතියෙන් ඉල්ලා අස්විය.

10. ඒ අනුව, ඉහත සඳහන් කරනු ලැබූ හේතූන් නිසාවෙන් අපේක්ෂිත මට්ටමට ඉලක්ක ලගාකර ගැනීමට නොහැකි වූ අතර,එබැවින් අපේක්ෂිත පරිදි ගෙවීම් කිරීමට ද නොහැකි විය.එබැවින් ඒ දක්වා අවසන් කර තිබූ වැඩ කොටස් සඳහා පමණක් මුදල් ගෙවීම් සිදුකල බව කාරුණිකව දන්වා සිටිමි.

**නිරීක්ෂණ හා නිගමන**

අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට නොහැකිවීම මත 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා මුදල් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවත්,ඉන් පසුව රජයේ නීති සම්පාදනය මෙම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ බැවින් එම අරමුණට පටහැනිව යමින් වෙනත් කරුණක් සඳහා ප්‍රමුඛතාවය දීමට ඇති අපහසුතාවය හේතුවෙන් සහ ව්‍යාපෘතියෙහි සම්බන්ධීකරණය සිදුකිරීම සඳහා නිලධරයෙකු නොමැතිවීම හේතුවෙන් අදාල මුදල් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බවත් නිරීක්ෂණය විය.

ඒ අනුව, දැනට ව්‍යාපෘතියෙහි කටයුතු සාමාන්‍ය පරිදි සිදුකරගෙන යනු ලබන අතර, සම්බන්ධීකරණය සිදුකිරීම සඳහා නිලධරයෙකු අලුතින් පත්කර ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකසා 2016.02.16 දින අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවත්, එහි අනුමැතිය ලැබුණු පසු නව ක්‍රියාකාරි සැලැස්මක් අනුව ව්‍යාපෘතියෙහි කටයුතු කඩිනම් කිරීමට බලාපොරොත්තු වන බවත් දන්වා සිටිමි.

ඩී.එස්.එච්. කුමාරජීව,
නීති කෙටුම්පත් සම්පාදක

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

(i) විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ මන්ත්‍රීවරුන් පෞද්ගලිකව ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියළු නීති නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

(ii) පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් සිව්දෙනෙකු බඳවා ගෙන ඇත.

(iii) පනත් කෙටුම්පත් කිරීමේ කටයුතු අප්‍රමාදව සිදුකිරීම සඳහා අවශ්‍ය නීති නිලධාරීන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

(iv) පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත් වල භාෂා පරිවර්තන කටයුතු සඳහා ප්‍රමාණවත් භාෂා පරිවර්තන නිලධාරීන්ගේ හිඟකමක් පවතී. දෙමළ භාෂා පරිවර්තක නිලධාරී හිඟකම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටුයතු සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන (නීති කෙටුම්පත් පරිවර්තනය කිරිම පිළිබඳ පළපුරුද්දක් ඇති) නිලධරයන්ගේ සහාය ලබාගෙන ඇත.

(v) පනත් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය වන ලේඛන සහකාර සහ සංස්කාරක තනතුරුවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

(vi) නීති නිලධාරීන්ගේ සහ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම ඉලක්ක කරගත් විවිධ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම සඳහා පුළුල් පරාසයක විහිදුනු අවස්ථාවන් ඔවුන්ට ලබා දී තිබේ.

(vii) දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කොට ඇති 'අ' ශ්‍රේණියේ පුස්තකාලය මඟින් දේශීය සහ විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

(viii) නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියළුම කාර්ය මණ්ඩල ආදර්ශමත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.